# සාරාංශය


කළමනාකරණ කාර්යයක් වශයෙන් මෙන්ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ගුණාත්මක බව හා සංවර්ධනය සඳහා ඉවහල් වන ක්‍රියාවලියක් ලෙස අභ්‍යන්තර අධීක්ෂණය පාසල් පද්ධතියේ දියුණුව උදෙසා වැදගත් වෙයි. පාසලේ ගුරුවරුන්ගේ සංවර්ධනය තුළින් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම මගින් සමබර පෞරුෂයක් ඇති දරු පරපුරක් දැයට දායාද කිරීම එහි ප්‍රධාන අපේක්ෂණය වෙයි. නමුත් පාසල් අධීක්ෂණ ක්‍රියාවලියෙහි යෙදීමේදී විවිධ අඩුපාඩු සහ විෂමතා ඇති වන බව පෙනී යයි. එම නිසා වර්තමාන පර්යේෂණය තුළින් ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය විමසා බලන ලදි.

මෙහි සාහිත්‍ය විමර්ශනය, න්‍යායාත්මක සහ පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය යන ක්ෂේත්‍ර දෙක ඔස්සේ සිදු කර ඇත. එහිදී අධීක්ෂණය යන සංකල්පයෙහි අඩංගු විවිධ අධීක්ෂණ ප්‍රවර්ග ගැන විමර්ශනය කර ඇති අතර, අධ්‍යාපනික අධීක්ෂණය හා එහි විකාශය මෙන්ම ශ්‍රී ලංකාවේ එහි ආරම්භය හා විකාශනය පිළිබඳව ද විස්තර ඉදිරිපත් කර ඇත. එමෙන්ම අධීක්ෂණ භූමිකා, ක්‍රම ශිල්ප, දේශීය, විදේශීය පර්යේෂණ පිළිබඳවද අධීක්ෂණයේ වැදගත්කම, දුර්වලතා, ප්‍රබලතා වැනි කරුණු රාශියක් අධ්‍යයන සාහිත්‍ය තුළ විමර්ශනය කරනු ලැබිය.

පාසල් වල වර්තමාන අභ්‍යන්තර අධීක්ෂණයේ ස්වභාවය හා ඉන් සිදුවන ගුරු සිසු සංවර්ධනය මෙන්ම එයට සහභාගි වන අයගේ සංජානන පරීක්ෂා කිරීමත් අභ්‍යන්තර අධීක්ෂණ වැඩපිළිවෙල දියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු විය. ඒ අනුව විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයෙහි නියැදි සමීක්ෂණ ප්‍රවේශය යටතේ ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ ලේඛන සමීක්ෂණ දත්ත රැස්කිරීමේ උපකරණ ලෙස භාවිතා කරන ලදි. නියැදිය ලෙස අම්පාර දිස්ත්‍රික්කයේ පාසල් තුනක අභ්‍යන්තර අධීක්ෂකවරුන් 16 දෙනෙකුගෙන් සහ ගුරුවරුන් 26 දෙනෙකුගෙන් ලබා ගත් දත්ත, ප්‍රතිශත, වගු, කයි වර්ග පරීක්ෂා, යන සංඛ්‍යාන ක්‍රම ඇසුරින් විශ්ලේෂණය කර අර්ථකථනය කරන ලදි.

මෙහිදී ප්‍රධාන අනාවරණ ලෙස නියැදියේ පාසල්වල අධීක්ෂණය සුහදව සිදුවන බව හා අභ්‍යන්තර අධීක්ෂකවරුන් ඉහළ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් වලින් යුක්ත වුවන් බව හඳුනාගත් අතර, ක්‍රියාකාරී අධීක්ෂණ කමිටු පාසල්වල පවතින බවට ද කරුණු අනාවරණය විය. නමුත් අධීක්ෂණ සැලසුම් සකස් කිරීම හා අධීක්ෂණයේ අඛණ්ඩව නිරත වීම, සතුටුදායක මට්ටමින් නොපැවතීමෙන් අධීක්ෂණ කමිටු ක්‍රියාකාරිත්වය සාර්ථක මට්ටමින් සිදු නොවන

බව ද, අධීක්ෂණය වෙනුවෙන් පවතින කාලය ප්‍රමාණවත් නොවන බව හා ගුරු අධීක්ෂණය පිළිබඳ විදුහල්පති නියාමනය ප්‍රමාණවත් නොවන බවද හෙළිදරව් විය. එසේම අධීක්ෂණයෙන් පසු අධීක්ෂණ සාකච්ඡා එලදායි අයුරින් සිදු නොවන බවත්, පාසලෙන් බාහිරව ගුරු සංවර්ධනය සඳහා යොමු කිරීම සිදුවන්නේ අධීක්ෂණ අනාවරණ මත නොවන බවත් අනාවරණය කර ගන්නා ලදි. අභ්‍යන්තර අධීක්ෂණය පිළිබඳ ගුරුවරුන්ට වඩා අධීක්ෂකවරු ධනාත්මක ආකල්ප වලින් යුක්ත බව පැහැදිලි විය.

මේ අනුව පාසල්වල අභ්‍යන්තර අධීක්ෂණය සැලසුම් සහගතව සංවිධානය කිරීම මෙන්ම අධ්‍යාපනික ක්ෂේත්‍රයේ අදාළ ආයතන මගින් අධීක්ෂකවරුන්ට පුහුණු පාඨමාලා සංවිධානය කිරීම ආදිය මගින් අභ්‍යන්තර අධීක්ෂණයේ නිසි එල නිසි කල නෙළා ගැනීමට පාසල් වලට හැකියාව ලැබෙනු ඇත.